# පහසු සෝයා වගාවට උපදෙස්

(රංජිත් මුල්ලේරියාව විසිනි)

**සෝ**යා වගා කාලය ඔක්තෝබරයේ ආරම්භ වෙයි. "පරණ පුරුදුකාරයෙකු" වශයෙන් කිසියම් උපදෙසක් දීම මේ වසරේ සෝයා වගා කරන්නට පුල පුලා බලා සිටින ඔබ සැමට ප්‍රයෝජනවත් වෙතියි සිතමි.

සෝයා ඉතාම පහසුවෙන් වගා කළ හැකි බෝගයෙකි. එහෙත් සමහර විට තරමක් "ප්‍රශ්න කාරී" විය හැකිය. විශේෂයෙන්, පැළවෙන අවස්ථාවේත් ඉන් ටිකකට පසුවත්ය. මේ රටේ සෝයා වගාවේදී මතුවන ප්‍රශ්න මෙසේය.

## නුසුදුසු බීජ

ළඟ පහත පිහිටි සිල්ලර කඩයකින් සෝයා ඇට ලබා ගත් ඔබට සමහර විට එක් කරුණක් පෙනී යන්නට ඇත. එනම් එයින් පැළවෙන්නේ ඇට කිහිපයක් පමණක් බවයි. ඒඇයි? උෂ්ණත්වය වැඩි එසේ නැත්නම් තෙතමනය වැඩි තත්ත්වයන් යටතේ ගබඩා කොට තබතොත් කව්පි, මුංඇට, කඩල ආදිය මෙන් නොව සෝයා බෝංචිවල පැළවීමේ හැකියාව අඩුවෙයි. එවැනි අහිත කර තත්වයන් යටතේ සති කිහිපයක් වුවද ගබඩා කොට තැබුවහොත් බොහෝ සෝයා වර්ග වල පැළවීමේ හැකියාව හීනවෙයි. සර්ම කලාපික තත්ත්වයන් යටතේ හය මාසයක් පමණ පැළවීමේ හැකියාව රැක සිටිය හැක්කේ "නුවරඑළිය" දේශිය වර්ගයේ පොඩි බීජ වලට පමණක් බව පෙනේ. එබැවින් වගා කිරිම සඳහා වූ සෝයා ඇට අඩු උෂ්ණත්වයෙකින් හා තෙතමනයකින් යුත් තත්ව යන් යටතේ ගබඩා කර තැබිය යුතුය. සිසිල් කාමරයක නම් වඩා හොඳය. කෘෂිකර්ම දෙපාර්ත මේන්තුව සුදුසු පිළිවෙලකට සෝයා බීජ ගබඩා කරයි. බීජ ලබා ගන්නට අදහස් කරන උදවිය එතැනින් ලබා ගත යුතුය.

පැළවීම සඳහා සෝයා බෝංචි වලට, කව්පි හෝ මුංඇට ආදියට වඩා පසේ තෙතමනයක් අවශ්‍යය. එම නිසා තරමක තෙතමනයක්ද ඇති බිමක සෝයා වගා කළ යුතුය.

සෝයා පැළවී බොහෝ වීට පොලෝ මට්ට මින් මතු නොවන්නේ ඕනැවට වඩා ගැඹුරින් බීජ සිටුවීම නිසාය. හොඳ ප්‍රතිඵල ලැබීමට නම් අඟලේ සිට අඟල් එකහමාර දක්වා යටට සිටු විය යුතුය. නියම තත්වයන් යටතේ සිටුවූ දින තුන හතරෙකින් පැළ මතුවනු ඇත.

පස ඇලෙන ගතියක් දක්වන වඩාත් තෙත් කාලගුණයක සෝයා නොසිටුවිය යුතුය. ඊළඟට එළඹෙන වියළි කාල ගුණයේදී පස වේළී ඝන තට්ටුවක් වශයෙන් සිටිය හැකි බැවිනි. එබඳු තත්වයක් ඇති වුණොත් පැළයට මතුවීම අසිරු විය හැකිය.

## හාවන් සහ ගිරවුන්

පැළ පේළියට හිස් තැන් තිබීමත් පැළ අතර සම දුර ප්‍රමාණයක් නොතිබීමත් නිසා ඇති වන්නේ අක්‍රමවත් භාවයකි. මේ අක්‍රමවත්භාවය අස්වැන්න අඩුවීමට ප්‍රධාන හේතුවක් වෙයි. එම නිසා මුල සිටම වගා පේළිවල ක්‍රමවත් භාවයක් තබා ගන්නට වග බලා ගත යුතුය.

නිල කොබෙයියන්, පරෙවියන්, ගිරවුන් වැනි කුරුල්ලෝ සෝයා බෝංචි කුඩා පැළවලට විශේෂයෙන් කොල හට ගැනිමට ඔන්න මෙන්න කියා තිබියදී, ලොකු කැමැත්තක් දක්වති. මෙවැනි කුරුල්ලන් බහුල පළාත්වල විශේෂයෙන් පාන්ද-

රත් සවස් වරුවේත් ඔවුන් පළවා හරින්නට කෙනෙකු යොදවා ගැන්ම අවශ්‍ය විය හැකිය. බීජ සිටුවා තුන්වැනි දවසේ සිට දවස් තුනක් පමණ යන තුරු මෙසේ කිරීම ප්‍රයෝජනවත්ය.

සෝයා පැළවෙන අවස්ථාවේ ප්‍රධාන තර්ජනයක් හාවන්ගෙන් එල්ල විය හැකිය. ඔවුන් සෝයා බෝංචි වගා බිම් වලට පැමිණ හානි සිදු කරනුයේ එක්කෝ සවස 7 ට පමණය. එසේ නැත්නම් පාන්දර 4 ට 5 ට පමණය. වතුර ගැලුම් තුනකට පැරතියොන් දියර අවුන්සය බැගින් කලවම් කොට වගාව පුරා ගැසීමෙන් හාවන් විනාශ කළ හැකි බව ඔප්පු වී තිබේ.

සුදුසු පරිදි බිම සකස් නොකිරීම නිසාද අක්‍රමවත්භාවය ඇති වෙයි. බීජ එක ක්‍රමයකට පැළවීමට නම් බිම මනාසේ සකස් කොට ගත යුතුය. හැම තැනම එක මට්ටමකට තිබීමත් වළවල්, පහත් තැන් ආදියෙන් තොරවීමත් අත්‍යාවශ්‍යය. වළවල් ආදිය ඇති තැන මෝසම් වැසි වතුර රඳා පවතිනු ඇත. වතුර හිරවී තිබීම බීජ පැළවීමට බාධාවෙකි. අන්තිමේදී පේළිවල අක්‍රමවත් භාවයක් හට ගනී.

මේ ලිපියේ දක්වා ඇති උපදෙස් පිළිපැදීමෙන් සෝයා වගාව ලෙහෙසි වූත් පලදායී වූත් වගාවක් බව ඔබට දැනගන්නට ලැබෙනු සිකුරුයි.

(සෝයා පුවත් අනුග්‍රහයෙනි)